# සම්ප්‍රේෂිත අත්පිටපතක පාඨාන්තර දෝෂ හඳුනාගන්නේ කෙසේද?

- දිවුලපැලැස්සේ විමලානන්ද හිමි

## හැඳින්වීම

යම් ග්‍රන්ථයක් පිළිබඳ ලියන ලද ලේඛනය අත්පිටපත හෙවත් පුස්කොළ (Manuscript) පිටපතයි. පිසදමා පිරිසිදු කළ හිස් තල කොළ පුස්කොළ නමින් ද ඒ කොළවලින් සකස් කර රචනා කරන ලද පිටපත් පුස්කොළ පොත් නමින් ද හැඳින්වේ.[1] මේවා ලක්දිව තුළ Palm-leaf Manuscript යනුවෙන් ද දකුණු ඉන්දියාවේ Ola-leaf Manuscript යනුවෙන් ද ප්‍රචලිත වී තිබේ. මුල් පිටපතකින් තවත් පිටපතක් රචනා කරනු ලබන්නේ වර්තමානයෙහි ඡායා පිටපත් කරන්නාක් මෙන් යාන්ත්‍රික ප්‍රතිනිෂ්පාදනයක් කිරීමෙන් නොව, මානව බුද්ධිය විසින් මෙහෙයවනු ලබන ක්‍රියාකාරකමක් වශයෙනි. එසේ නිපදවනු ලබන අනුපිටපත ආදර්ශ පිටපතේ දෙවැන්නක් මිස එහිම ප්‍රතිනිෂ්පාදනයක් නොවේ. අනුපිටපත ආදර්ශ පිටපතට කිසිසේත් සමාන විය නොහැකි අතර දෝෂ ඇතිවීමේ ප්‍රවණතාව ද නොවැළැක්විය හැකිය.

පුස්කොළ පොත් වශයෙන් අපට ලැබී ඇත්තේ ලේඛකයන් ලියූ මුල් පිටපත් නොවන අතර කීපවරක් පිටපත් කරගත් පිටපත්වලින් ලබාගත් පිටපත්ය. පුස්කොළ පොතක් පිටපත් කිරීම යාන්ත්‍රිකව සිදු නොකරන ලද්දක් නිසා මුල් පිටපතට වඩා පසුව ලියූ පිටපත්වල කොතෙකුත් වෙනස්කම් ඇතිවිය හැකිය. ඒ සියලුම පිටපත්කරුවන් යන්ත්‍ර නොව, මිනිසුන් වන හෙයිනි. පිටපත් මාලාවක කාලය දිගු වීම එහි වෙනස්කම් බොහෝමයක් ඇතිවීමට ද හේතු වේ. පිටපතක කාලය නිශ්චය කළ යුත්තේ එහි අගය, වටිනාකම නිශ්චය කිරීම සඳහාය. අප විසින් යම් ලිපියක් හෝ ග්‍රන්ථයක් මුද්‍රණය කිරීමේ දී අකුරු වැරදි තැන්, ප්‍රමාද දෝෂ ඇති විය හැකි අතර සෝදුපත් බලන්නන් විසින් ඒවා නැවත නිවැරදි කරයි. එහෙත් යම් පිටපතකින් තවත් පිටපතක් පිටපත් කිරීමේ දී සිදුවන දෝෂ ඉවත් නොවී දිගටම පවතියි. ඇතැම් විට පිටපත් කරන තැනැත්තාට මුල් පෙළ වැරදි ලෙස

කියවෙයි. ඇතැම් තැන් ඇසට මග හැරී නොපෙනී යයි. එකම දේ වැරදීමෙන් දෙවරක් ලියවිය හැකිය. ඇතැම් ලේඛකයෝ වැරදි යැයි දකින ඇතැම් තැන් නිවැරදි කිරීමට යති. පුස්කොළ පොතක පිටු පෙරළීමේ දී ඇතැම් විට පිටු දෙකක් එකවිට පෙරළී යා හැකිය. එසේ වුවහොත් සම්පූර්ණයෙන් ම කොටසක් පිටපත් කිරීම මගහැරෙයි. එසේම පිටපතෙහි විශාල කොටසක් මග හැරුනා සේ ම පාඨකයා ව්‍යාකුලත්වයකට ද පත්කෙරේ. පුස්කොළ පොතක පත්ඉරු මාරු වී තිබුණොත් සිදුවනුයේ ද විශාල ව්‍යාකුලත්වයකි. පත්ඉරුවක අග කැඩී බිඳී යාමෙන් ග්‍රන්ථයේ කොටස් අඩුවිය හැකිය. පිටපත් කරන්නා ඇතැම් විට අක්ෂර වින්‍යාසය, න ණ ල ළ භේදය, ශ ෂ ස භාවිතය, ව්‍යාකරණ ප්‍රයෝග ආදිය නිවැරදි කරන්නට ද යයි. පිටපත් කරන්නන් දෙදෙනෙක් එක් පිටපතක් සකස් කිරීමේ දී එකම කෘතියක විෂමතා කීප අයුරකින් දැකිය හැකිවේ. අක්ෂර රටාවෙහි ද සමානත්වයක් නොවේ. මේ සියලු කරුණු කෙරෙහි පර්යේෂකයා විශේෂ අවධානයක් යොමුකිරීම අවශ්‍යම කරුණකි. එහි දී ශාස්ත්‍රීය සංස්කරණයකින් අපේක්ෂිත කාර්යය වනුයේ මුල් පෙළට ඇති පාඨාන්තර සියල්ල සමීක්ෂණය කර මුල් කර්තෘගේ පෙළ කුමක්දැයි නිශ්චය කිරීමට තැත් කිරීම හෝ ඊට හැකිතාක් සමීප පෙළක් සකස් කිරීමයි. නොහොත් ප්‍රතිනිෂ්පාදනය කිරීමයි. එය පහසු කාර්යයක් නොවනු ඇත.

## පිටපත් වංශාවලිය සකස්කර ගැනීමේ වැදගත්කම

ග්‍රන්ථයක් සම්පූර්ණයෙන් නැති වී නොමැති නම් එම ග්‍රන්ථය ක්‍රම දෙකකින් සම්ප්‍රේෂණය හා පවත්වා ගැනීම සිදුවී ඇත. එනම් එක් පිටපතකින් හෝ එකකට වැඩි අත්පිටපත් ගණනකිනි. අත්පිටපත් රාශියක් ඇති විට ඒවා ගැලපීමෙන් හා මනාව පරීක්ෂා කිරීමෙන් පසුව ඒවා අතුරින් වඩා විශ්වාසදායක අත්පිටපත් තම ග්‍රන්ථ සංස්කරණය සඳහා තෝරාගත යුතුය. විශ්වාස කටයුතු අත්පිටපත් ගණනාවක් ඇති විට අත්පිටපත්වල වංශ පරම්පරාව (Pedigree or stemma codicum)[2] සකස්කර ගත යුතුය. ග්‍රන්ථයක විවිධ වූ පිටපත් ඒවා සියවස් ගණනාවක් ඔස්සේ පිටපත් කරමින් ලිඛිත සම්ප්‍රේෂණයක තිබූ බැවින් අවසාන වශයෙන් එකිනෙකින් ස්වාධීනව පැවතිය හැකිය. පවත්නා අත්පිටපත් බොහෝවිට දැන් නැති නමුත් පෙර තිබූ එක් පිටපතකින් බිහි වූ විවිධ සම්ප්‍රදායයන් ඔස්සේ පැමිණි ඒවාය. මෙම මුල්කෘතිය

ලිඛිත මූල රූපයක් නම් අවසානයේ ඒ කරා යන පිටපත් හා ආකෘතීන් පරම්පරාවක් තිබේ. මෙම සම්ප්‍රේෂණයට සාපේක්ෂව සියලු තොරතුරු සොයාගත හැකි නම් පර්යේෂකයාට එම සම්ප්‍රේෂණයේ නිවැරදි පෙළපත් පරම්පරාව (Pedigree) ගොඩනගාගත හැකිය.

පැරණිම පිටපත ලබා ගත නොහැකි අතර අවශේෂ පිටපත්වල පොදු ලක්ෂණ සැලකීමෙන් මුල් ආකෘතිය පිළිබඳ අවබෝධයක් කල්පිත වශයෙන් ලබා ගත හැකිය. සියලු පුස්කොළ පිටපත් වෙන් වෙන් පොත් පරම්පරාවලට අයත් නොවන බැවිනුත් එකම පොත් පරපුරකට අයත් පිටපත් රැසක් තිබිය හැකි නිසාත් පුස්කොළ පොත්වල වංශ පරම්පරාව නිශ්චය කරගැනීම වැදගත්ම කාර්යයයි. ගවේෂණයේ දී හමුවෙන පුස්කොළ පිටපත් තවමත් විද්‍යමාන වූ එක් ගුරු පිටපතකින් කරන ලද පිටපත් ලෙස අවබෝධ වුවහොත් මුල් පිටපත් පමණක් ඇසුරු කිරීම ප්‍රමාණවත්ය. සාමාන්‍යයෙන් පිටපත් පරපුරක් ම එකක් පසු එකක් ලියවීම සිරිත වුවත් අන්‍යොන්‍ය බලපෑම් ද කිසිවිටක දක්නට ලැබේ. එබඳු තැන්වල ඇසුරු කළයුතු පිටපත් තේරීම සැලකිල්ලෙන් කළයුතු වේ.

පිටපත් පරම්පරා අනුව යෝග්‍ය යැයි වැටහෙන පුස්කොළ පොත් සංඛ්‍යාවක් තෝරා ගැනීම ග්‍රන්ථ සංස්කරණයේ දී සාමාන්‍යයෙන් කරනු ලබන සිරිත වුවත් කිසිවිටෙක අනවශ්‍ය යැයි හැඟෙන පොත්වල පවා හොඳ පාඨ තිබිය හැකි බව අමතක නොකළ යුතුය.

අත්පිටපත්හි ප්‍රභවය තීරණය කිරීමේ සාමාන්‍ය න්‍යාය නම් පාඨයන්ගේ සමරූපතාව ප්‍රභවයේ සමරූපතාව අඟවයි යනුයි. යම් පාඨයක මූලාශ්‍රය කතුවරයාගේ අත්පිටපතම ද විය හැකිය. එසේ නොමැතිනම් එය සම්ප්‍රේෂණ පරම්පරාවේ අත්පිටපතක් විය හැකිය.

මජ්ඣිමනිකායෙහි අත්පිටපත් 30ක් තිබේ යැයි සිතමු. එහි යම් සූත්‍රයක එක් පාඨයක් හෝ වාක්‍ය කාණ්ඩයක් අත්පිටපත් 15ක් සමරූපතාවකින් ද අනිත් අත්පිටපත් 10 කින් සහ තවත් 5කින් එය වෙනස්ව පෙන්නුම් කෙරේ නම් එයින් කියවෙනුයේ එක් සමාන පාඨය ඇති අත්පිටපත් 15 ම පොදු මූලාශ්‍රයකට නැකම් කියන බවයි.

එසේ ම එම පාඨය සම්බන්ධයෙන් සම්මිශ්‍රණයක් නොවේ නම් අනිත් 10 සහ 5 ද පොදු මූලාශ්‍රයකින් හෝ දෙකකින් පැවතෙන බවයි. ලාංකේය අත්පිටපත්වල වංශාවලිය සැකසීමේ දී පාඨ සමරූපතා සහ විෂමතා කෙරෙහි මෙන්ම වෙනත් සාධක කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. බොහෝ පිටපත් අවසානයේ ලිඛිත කාලය දක්වා තිබීම වංශාවලිය සැකසීමට විශාල දායකත්වයක් ලබාදෙයි. එසේම පළාතානුබද්ධව අත්පිටපත් අධ්‍යයනයෙන් ද සිදුකළ හැකිය. විශේෂයෙන් මධ්‍යම පළාතානුබද්ධ පිටපත් බෙහෙවින් දළදාමාළිගාව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, අස්ගිරි පාර්ශ්වයානුබද්ධ විහාරස්ථාන සහ පුෂ්පාරාමානුබද්ධ විහාරස්ථානවලින් ලැබෙන අත්පිටපත් සමරූපිතාවකින් යුක්ත වේ. දකුණු පළාතට අයත් බොහෝ අත්පිටපත් මේවායින් තරමක් වෙනස් ස්වරූපයකින් යුක්ත වන ආකාරය දැකිය හැකිය. එසේම වංශාවලිය සැකසීමේ දී සැලකිය යුතු තවත් කරුණක් වේ. එනම් ක්‍රිස්තු වර්ෂ පළමු සියවසේ වට්ටගාමිණී අභය නිරිඳුන්ගේ රාජ්‍යානුග්‍රහයෙන් ආලෝක විහාරයේ දී ත්‍රිපිටකය පුස්කොළ පොත්වල ලේඛනගත කොට සියම් දේශය, බුරුමය, කාම්බෝජය වැනි ථේරවාදී රටවලට ව්‍යාප්ත කරන ලදි. එහෙත් කාලිංගමාඝ වැනි ආක්‍රමණිකයන් නිසා ලාංකේය පුස්තක රාශියක් විනාශයට පත් කිරීම හේතුවෙන් බොහෝ පිටපත් ලාංකිකයන්ට අහිමි විය. නැවත මහනුවර අවධියේ දී සංඝරාජ සරණංකර තෙරුන්ගේ උත්සාහයෙන් සියමෙන් සියම් උපසම්පදාව සමඟ ත්‍රිපිටක ග්‍රන්ථත් මරම්ම හෙවත් බුරුම දේශයෙන් අමරපුර සහ රාමඤ්ඤ නිකායික උපසම්පදාව සමඟ ත්‍රිපිටක ග්‍රන්ථත් මෙරටට ගෙන්වා ගන්නා ලදි.[3] මේ නිසා සියම් පාර්ශ්වයට අයත් විහාරස්ථානවලින් හමුවෙන අත්පිටපත් සමරූපතාවකිනුත් අමරපුර සහ රාමඤ්ඤ පාර්ශ්වයන්ට අයත් විහාරස්ථානවලින් හමුවෙන අත්පිටපත් එක් ස්වභාවයකිනුත් යුක්ත වන ආකාරය ද සැලකිය යුක්තකි. එබැවින් වංශාවලිය සැකසීමේදී ඓතිහාසික අත්පිටපත් සම්ප්‍රේෂණය පිළිබඳව ද ප්‍රාමාණික අවබෝධයක් ලබා තිබීම අවශ්‍යයය.

අත්පිටපත් 30ක් ඇත්නම් එයින් 15ක්ම එක් මූලාශ්‍ර පිටපතකින් පැමිණ ඇතැයි දැනගත හැකි නම් වංශාවලිය සකස් කරගැනීමේ ප්‍රශ්නය ඉතාම සරල වේ. එනම් මව් මූලාශ්‍රය (මුල්පිටපත, මව්පිටපත - Autograph) ඇති නිසා එම මව් මූලාශ්‍රය පලුදු වී නැති හෙවත් දෝෂ

නැති හැම තැනදීම අනිත් පිටපත් 15 ඉවත්කළ හැකිය.

මෙහි දී A B C D E F යනු බෙහෙවින් සමාන ලක්ෂණ ඇති පිටපත් යැයි සිතමු. එයින් B C යන පිටපත් දෙකත් D E F යන පිටපත් තුනත් වඩාත් ළඟින් සමානකම් දක්වතැයි සිතමු. එවිට පිටපත් වංශාවලිය සැකසීමේ දී සිතාගත යුත්තේ B C පිටපත් දෙක පොදු එක මුල් පිටපතකිනුත් (කල්පිත ආදි ආකෘතිය - Hyparchetype) D E F යන තුන තවත් මුල් පිටපතකිනුත් ලබාගන්නා ලද පිටපත් බවයි. ග්‍රන්ථ සංස්කරණ කාර්යයේ දී පරම්පරා වෘක්ෂය නිර්ණය කිරීම ඉතා සැලකිල්ලෙන් සහ ප්‍රවේශමෙන් කළ යුතු දෙයකි.

## මුල් පිටපත සහ උපකල්පිත මව් පිටපත හඳුනාගැනීම

කතුවරයා සිය අතින් ලියූ ලේඛනය හෙවත් කර්තෘ ලේඛනය (සිය අත්ලිපි) මුල්පිටපත (Autograph)[4] නමින් හැඳින්වේ. පාඨ ග්‍රන්ථ විචාරය භාවිත වනුයේ මෙය මූලපාදක කොට ගෙනය. පාඨ ග්‍රන්ථ විචාරයට ලිඛිත ලේඛනයක් අවශ්‍යය. පාඨ ග්‍රන්ථ පිළිබඳ මුල් ලිඛිත සටහන් ඉතා විරලය. ඒවා පියවර 3ක් ඔස්සේ පවත්වාගෙන එන ලදි.

1. කතුවරයා සිය අතින් ම ලියූ ලේඛන (Autographs)
2. කර්තෘ ලේඛනයට ආසන්න පිටපත් (Immediate Copies)
3. පිටපත්වලින් කළ පිටපත් (Copies of Copies)

පාඨ ග්‍රන්ථ විචාරයේ දී පර්යේෂකයාට වැඩිපුර හමුවෙනුයේ මෙහි තෙවැනි අවස්ථාව වූ පිටපත්වලින් කළ පිටපත්ය. එහෙත් මුල්පිටපත (Autograph) ග්‍රන්ථ විචාරයේ දී බැහැර කරනුයේ නොවේ. එය සොයා ගැනීම අතිශය දුෂ්කර හෝ විවිධ කාලවල දී විනාශයන්ට නතුවීමෙන් නැවත කිසිසේත් එය සොයා ගැනීමට නොහැකි හෙයින් පශ්චාත් කාලීන පාඨ ග්‍රන්ථ විචාරයේ දී පිටපත්වලින් කළ පිටපත්වලට (අනුපිටපත්) මූලකෘතියේ කාර්යය ඉටුකිරීමට සිදුවේ. එහෙත් ආදර්ශ පිටපතට වඩා අනුක්‍රමණික පිටපත්වල දෝෂ ඇතිවීම ඉතා බහුලය. මුල් පිටපත්වල සහ ආසන්න පිටපත්වල ක්‍රමික අභාවය හේතුකොට ගෙන පිටපත්වලින් කළ පිටපත් හෙවත් අනුපිටපත්වලට මූලකෘතියේ කාර්යය ඉටුකිරීමට සිදුවේ.

ආදි ආකෘතිය (Archetype)[5] හෙවත් උපකල්පිත මව් පිටපත යනුවෙන් අදහස් කරනුයේ පරිකල්පනය කරන ලද ආදර්ශ පිටපතයි. මෙම පිටපතෙහි පෙළ අනතුරුව බිහිවන සෑම පිටපත්හිම ඇතිවිය හැකි වැරදිවලින් තොර වූවක් ලෙසත් ඒ නිසාම දැනට පවත්නා සෙසු සාධක පිටපත්වලට වඩා මුල්පිටපතට සමාසන්න වූවක් ලෙසත් පිළිගැනේ. යම් හෙයකින් මෙහි පෙළ නිවැරදි ලෙස ගොඩනඟා ගැනීමට හැකි වුවහොත් මුල් පිටපත ප්‍රතිපාදනය කිරීම අසීරු නොවනු ඇත. ආදි ආකෘතියෙන් පැවත එන පිටපත් වංශාවලිය කල්පිත ආදි ආකෘතිය (Hyparchetype or Sub-archetype) නමින් හැඳින්වේ.

## පුස්කොළ පොත් සම්ප්‍රේෂණය

විස්තෘත පිටපත් එක් තැනකට එකතුකර ගැනීම සම්බන්ධයෙන් සම්ප්‍රේෂණ (Transmission)[6] ක්‍රමවේද දෙකකි.

1. නෛතික හෝ සංරක්ෂිත සම්ප්‍රේෂණ (Licened or Protected Transmission)
2. අසංවිධිත හෝ අනාරක්ෂිත සම්ප්‍රේෂණ (Haphazard or Unlicensed Transmission)

නෛතික සම්ප්‍රේෂණය යනු පාලනයක් සහ විධිමත් බවක් ඇතිව සංරක්ෂණය කර පවත්වාගෙන එනු ලබන පිටපත් සමූහයයි. විශේෂයෙන් සංස්කෘත වේදග්‍රන්ථ සාහිත්‍යය, පාලියෙහි ත්‍රිපිටක සාහිත්‍යය මේ ගණයට අයත් වේ. පුරාතනයේ සිට ඒවා භාණක පරම්පරාවන් විසින් මුඛපාඨ වශයෙන් පවත්වාගෙන අවුත් පසු අවධීන්හි පුස්කොළ පිටපත් ලෙස ලේඛනගතව වර්තමානය දක්වා පැවත එනුයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. මෙහි දී මූලික පිටපත්කරණය සිදුවනුයේ මුල් කතුවරයාගේ හෝ ඔහුගේ ප්‍රධාන ශිෂ්‍යවරයෙක් විසින් හෝ නියෝජිතයෙක් විසිනි. නොඑසේ නම් ආදර්ශ පිටපතේ උගත් අනුපිටපත් රචනා කිරීමේ අධීක්ෂණය සඳහා පත්කළ නිසි උගත් මණ්ඩලයක් ඉදිරියේ දීය. එනම් සියලු පිටපත්වල ඒකීයත්වය සහතික කිරීම පිණිස පිටපත්කරුවන් කිසියම් පාලනයකට නතුකිරීමයි. මෙවැනි පාලනයකින් තොරව පිටපත්කරණය ඒ ඒ ලේඛකයන්ගේ ස්වාධීනත්වය මත සිදුකළහොත් මුල් කතුවරයා ජීවමාන සමයේදීම

වුව ද කෘතියේ ඒකීයත්වය විනාශ වී යා හැකිය. කතුවරයා මියගිය අවස්ථාවක දී එවැනි අප්‍රමාණ දූෂණයන්ට පත්වීමට ඇති ඉඩ බෙහෙවින් අධිකය.

අසංවිධිත හෝ අනාරක්ෂිත සම්ප්‍රේෂණය ඉතා බහුල වශයෙන් දක්නට ලැබෙන ක්‍රමවේදයයි. මෙහි දී අත්පිටපත් සකස්කරනු ලබන්නේ තමන් පිටපත් කරන ග්‍රන්ථය පිළිබඳ අවබෝධයක් නොමැති, ඒවායෙහි අර්ථය පිළිබඳ සැලකිලිමත් නොවන නොවියත් පුද්ගලයන් විසිනි. යම් ආචාර්ය පරම්පරාවක ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර ද මේ යටතට අයත් විය හැකිය. පෞද්ගලික වශයෙන් සකස්කරන ලද එවැනි පිටපත් සම්බන්ධයෙන් පැවැති ප්‍රධාන බාධාව වනුයේ මූලාදර්ශ අතිසුරක්ෂිත ලෙස සලකනු ලැබූ උගතෙකුට වුවද ඒවා පරිහරණය කිරීමට නොදී ස්වාධීනව, උද්‍යෝගීමත්ව ආරක්ෂා කරනු ලැබීමයි.

## පාඨාන්තර රැස්කිරීම

ග්‍රන්ථ සංස්කරණයක දී පළමුවෙන් ම සිදුකළ යුත්තේ පාඨාන්තර රැස්කර තබා ගැනීමයි. නිරවද්‍ය පාඨය නිශ්චය කරගත හැකි වන්නේ ඉන් අනතුරුවය. පාඨාන්තර සටහන් කර ගැනීමට පළමුව පුස්කොළ පිටපත් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට පරීක්ෂා කළ යුතුය. ඒවායෙහි ඇති සමාන අසමානකම්, පොත තිබූ ස්ථානය පිළිබඳ ඓතිහාසික පසුබිම, කාල නිර්ණය ආදිය විමසා අනතුරුව ඉතාම පැරණි යැයි සැලකිය හැකි පොත ගෙන එය ප්‍රධාන මූලාශ්‍රය ලෙස තබා අනිත් ඒවා පාඨාන්තර වශයෙන් දැක්විය යුතුය. එකම පරපුරක පුස්කොළ පොත් කීපයක් ම විමසීමෙන් කිසිදු විශේෂ ලක්ෂණයක් දැකිය නොහැකිය. එනිසා විවිධ ස්ථානයන්හි, විවිධ සම්ප්‍රදායයන්හි පොත් සපයා ගැනීම වඩා සාර්ථක කාර්යයයි. කර්තෘහුගේ පෙළ නිශ්චය කරගැනීම සඳහා ඉතා පැරණිම වූත් අදූෂිත වූත් පෙළ සොයා ගැනීම ඉතා වැදගත්ම කාරණයයි. පුස්කොළ පොත්වල අගය නිශ්චය කිරීම සඳහා ඒ එක එකක් විමසිල්ලෙන් පිරික්සා විශේෂ ලක්ෂණ ගොනු කරගත යුතුය. එම කරුණු ගවේශනයෙන් පුස්කොළ පිටපත් පරම්පරාව පිළිබඳව ද වැදගත් ලක්ෂණ කීපයක් සපයා ගත හැකි වෙයි. පැරණි පුස්කොළ පොත් සපයා ගැනීම සඳහා පොත්ගුල් විහාරවල, විශ්වවිද්‍යාල පුස්තකාලවල නාමාවලි සකස් කිරීම වඩාත් උචිතය.

මෙතෙක් නාමාවලි සකස් වී ඇත්තේ අතළොස්සකට පමණි. කේ.ඩී. සෝමදාසයන්ගේ ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය වටිනා සංගෘහිත කෘතියක් වුවත් එහි විද්‍යමාන පොත් අද බෙහෙවින් එම ස්ථානවලින් අතුරුදහන්ව ඇත. ඒ අනුව පොත් සොයා යන්නෙකුට සිදුවනුයේ මහත් අතපසුවීම්වලට පත්වීමටය.

## පිටපත් සැසඳීම

පාඨ ග්‍රන්ථ සංස්කරණයේ දී සපයාගත් පුස්කොළ පොත්වලට ම සීමානොවී ඒ සම්බන්ධව රචිත වෙනත් භාෂාමය පිටපත් කෙරෙහි ද අවධානය යොමු කිරීම සුදුසු වෙයි. ත්‍රිපිටක පොතක් සංස්කරණයේ දී පැරණිතම සිංහල අටුවා ග්‍රන්ථ, ව්‍යාඛ්‍යාන, සන්න, ගැටපදවල එන ඇතැම් පාඨ කෙරෙහි ද අවධානය යොමු කිරීම ද ආදි පෙළ නිශ්චය කිරීමේ දී වඩා වැදගත් වෙයි. පැරණි පොත්වලින් උපුටාගත් පාඨ පශ්චාත් කාලීන කෘතිවල ඇතොත් ඒවා කෙරෙහි ද අවධානය යොමු කිරීම අතිශයින් ප්‍රයෝජනවත් වේ.

යම් කෘතියක් සම්බන්ධයෙන් මේ වන විට ඉතිරිව ඇත්තේ එම කෘතිය පමණක්ම නම් එය ශෝධනය කිරීම විනා වෙන කිසිවක් කළ නොහැකිය. පිටපත් කිහිපයක් ඇතොත් ඒවා සංසන්දනය කරමින් සදෘශ විසදෘශතා විමර්ශනය කරමින් අන්‍යොන්‍ය සම්බන්ධය දක්වන පරපුර සකස් කිරීම සිදු කළ හැකි වෙයි. ඒ පිටපත් සියල්ල ආදි පිටපතක ආශ්‍රයෙන් ලිය වී විසිරී ඇති ඒවාය. වචන කොටස්, වාක්‍ය කාණ්ඩ, දිගු පාඨ සෑම පිටපතකම එකලෙස ගිලිහී තිබේ නම් හෝ පෙළේ ඇතැම් කොටස් සෑම පොතකම මාරු වී තිබේ නම් ඒ පිටපත් ආදි එක් පිටපතකින් පිටපත් කරගෙන එන ඒවා බව සිතිය හැකිය. විශේෂ පාඨ හා ලක්ෂණ ගණනාවක් ම පිටපත් රැසකට පොදු වේ නම් ඒ සියල්ල ආදි එක් පිටපතක් ඇසුරෙන් පැවත ගෙන එන ඒවාය. පිටපතක අක්ෂරවල හැඩය, ලේඛන සම්ප්‍රදායයන්ගේ පැරණිකම, පිටපතෙහි ලිඛිත වර්ෂය සඳහන් වී තිබීම, අතිරේක තොරතුරු වශයෙන් ලේඛක තොරතුරු, ස්ථානය පිළිබඳ තොරතුරු, සමාජ හා දේශපාලනික තොරතුරු ආදිය සපයා ගැනීමට හැකි වේ නම් ඒවා ද කාල නිර්ණය කිරීමට බෙහෙවින් උපකාරී වේ. මුල්

පිටපතක් සාමාන්‍යයෙන් සපයා ගැනීමට නොහැකි අතර ඊට සමීප හෝ හැකිතාක් දුරට පැරණි පිටපත් ලබා ගැනීම සංස්කරණ කාර්යයේ දී ඉතා වැදගත් වේ.

පාඨාන්තර රැස්කිරීමේ දී සහ ඒවා විමර්ශනයේ දී අවධානය යොමු කළ යුතු පැතිකඩ බොහෝය. එක විෂයක් සම්බන්ධයෙන් රචනා වී ඇති පුස්කොළ පොත් පෙළක් සන්සන්දනයෙන් එහි ප්‍රතිෂ්ඨාපිත පෙළ එකිනෙකට සදෘශ හෝ විසදෘශ විය හැකිය. සමාන වන්නේ නම් ආදි කෘතියෙහි පෙළපතට අයත් මූල කෘති විය යුතුය. වෙනස් වන්නේ නම් ආදි කෘතියට අයත් නොවන්නට ඉඩ තිබේ. එසේ වන විට ඇතැම් පිටපත් ආදි කෘතියට සම්බන්ධ වන අතර අනිකුත් ඒවා පිටපත්කරුවාගේ ලිපිදෝෂ සහ වැරදි අනුමානයන් නිසා මුල් කෘතියෙන් බැහැර කරනු ඇත. මෙහි දී විකල්ප (Variant)[7] වශයෙන් හැඳින්වෙන කියවීම් දෙකක් පිළිබඳ තෝරා ගැනීමක් සංස්කාරකවරයාට සිදුවේ. ඉන් එකක් ආදි කෘතියට සම්බන්ධ අතර නානාපාඨ හෙවත් විකල්ප පාඨ පෙන්වූ පිටපත් ආදි කෘතියෙහි විකල්ප ධාරකයන් (Variant bearers) ලෙස නම් කෙරේ. පිටපතක් පිරික්සීමේ දී එහි රචනා දෝෂ, වචන හෝ අකුරු එකතු කිරීම්, ඉවත් කිරීම් මෙන්ම සංශෝධකයන් විසින් කළ වෙනත් පිටපතකින් ගත් කියවීම් ආදිය ද ඇතුළත්ව තිබිය හැකිය. එහිදී පිටපත්කරුට නිවැරදි කියවීම තෝරාගැනීමට සිදුවේ. මෙහි දී නානාපාඨ (Variant Readings) හෙවත් විකල්ප කියවීම් බිහි වේ. මේවා පිටපත් සංශෝධකයන් (Reviser) හරහා ඇතිවේ. බෙහෙවින් නානාපාඨ විද්‍යමාන වනුයේ තේරුම් ගැනීමට දුෂ්කර වචන සම්බන්ධයෙන් හෙයින් එය නිවැරදිව තහවුරු කිරීමට පිටපත්කරු උත්සාහ ගත යුතුය.

පාඨාන්තර අධ්‍යයනයේ දී විශේෂ සංකේත හමුවෙනු ඇත. පද, වාක්‍ය අතර සංක්ෂේප බව දැක්වීම සඳහා යෙදූ උපක්‍රම භාවිතය එබඳු එක් අවස්ථාවකි. බොහෝවිට මෙම සංක්ෂිප්ත බව දැක්වීම සඳහා අක්ෂරයක්, සංඛ්‍යාවක් හෝ ඒ දෙකක එකතුවක් භාවිත කෙරේ. පිටපතක විශේෂ විමර්ශනාත්මක සටහනක් නිශ්චය කිරීමේ දී සලකුණක් (Siglum)[8] දැක්වීමේ ක්‍රමවේදය දැකිය හැකිය. ලාංකේය පුස්කොළ පොත්වල සංක්ෂේප කිරීමේ විශේෂ සලකුණ 'පෙය්‍යාල' භාවිතයයි. ඒ සඳහා .පෙ.

අක්ෂරය හෝ කුණ්ඩලී සලකුණ යොදාගැනේ. කුණ්ඩලීය ලාංකේය පුස්කොළ පොත්වලට පමණක් ආවේණික වූ විශේෂ යෙදීමකි. බුරුම, කාම්බෝජ, ලන්නා වැනි අග්නිදිග ආසියාතික පෙළ පුස්කොළයන්හි පෙයාාල සලකුණ වෙනුවෙන් අක්ෂර කීපයක්ම යොදාගනී. ඒ සඳහා .පෙ. හැරුණුකොට .ප. .ල. .ග. ඩ වැනි අක්ෂර කීපයක්ම යොදාගනු ලබන අතර එහි නිශ්චිත අර්ථවත් බවක් නොමැත.

දෝෂ සහිත පිටපතක් ලැබුණු විටෙක එහි කැඩී, බිඳී, ඉරී ගිය තැන් නිසා නැතිවන වචනයක්, අඩු වචනයක්, හිස්තැනක් (Lacuna)[9] හමුවිය හැකිය. පළමු පිටපතේ දී හමු වූ එම හිදැස දෙවන පිටපතේ ද එලෙසම තිබිය යුතුය. තෙවැනි පිටපතේ දී හිස් තැන නොතබා දෙපස අකුරු ගළපා තනි වචනයක් ලෙස එකතු කිරීමක් සිදුවුවහොත් එහි දී විශාල දෝෂයක් ඇතිවෙයි. ඇතැම්විට අකුරු දෙකක් තිබී ඉතිරි අකුරු නැතිව තිබෙන පිටපතක් නැවත පිටපත් කරන විට ඒ දෙක පමණක් කොපි කරයි. තෙවැනි පිටපත්කරු අතින් එය ඊළඟ වචනයට එකතු කළහොත් එහි දී ඇති වනුයේ ද විශාල දෝෂයකි.

එසේම පිටපත්වල සාක්ෂිවලට බාහිරව පොදු හැඟීම් භාවිතයෙන් අනුමානයන් නිර්ණය කරමින් පාඨයක් තුළ ඇති කියවීමක් සිදුවිය හැකිය. එහිදී මානව උපාය කෞශල්‍යයතාව උපයෝගීතාවයෙන් සිදුකෙරෙන එම කියවීම (Conjecture) අනුමාතික කියවීමයි. අනුමාතික කියවීම් පෙළෙහි එන වැදගත් සාක්ෂි මත පදනම් වෙමින් පොදු අර්ථයක් ගැනීම සඳහා කරනු ලබන ක්‍රියාවලියකි. එවැනි නිවැරදි කියවීමකට සංශෝධිත අනුමාතික කියවීමක් (Conjectural Emendation)[10] ලෙස හඳුන්වනු ලැබේ. ඇතැම් පුස්කොළ පොත්වල ව්‍යාකුල තැන්, මැකීගිය තැන්, හායනය වී ඇති තැන් වැනි දෝෂ නිසා මුල් පෙළ නිවැරදිව කියවීමට නොහැකි අතර එහිදී පර්යේෂකයා අනුමාතික කියවීම උපයෝගී කරගනිමින් කියවීම සිදුකෙරේ.

ලේඛනයේ දී කතුවරයා අතින් අනපේක්ෂිතව අක්ෂරයක්, වචනයක් හෝ වාක්‍යයක් එකම තැන දෙවතාවක් හෝ ඊට වැඩි වාර ගණනක් ලියවීමේ දෝෂ ඇතිවිය හැකිය. එබඳු ව්‍යාකුල තැන් පුනරුක්ති (Dittography/ Repetition)[11] දෝෂයි. මාතර කොඩිකාගොඩ රජමහා විහාරයේ ඇති

දීඝනිකාය පිටපතෙහි මහාපරිනිබ්බාන සූත්‍රයේ එන කොසිනාරකාරකා යන්නෙහි - රකා යනු ද, කූටාකූටාගාරං යන්නෙහි කූටා- යනු ද, පතිස්සතිස්සති යන්නෙහි - ස්සති යනු ද, මානුසාමානුසාමානුසුත්තමා යන්නෙහි මානුසා- යනු ද, කුරුණෑගල රිදීවිහාර දීඝනිකාය පිටපතෙහි පුනච පුනච පරං යන්නෙහි පුනච යනු ද එසේ පුනරුක්ති දෝෂ විද්‍යමාන නිදර්ශන පාඨ කිහිපයකි.

පිටපත් රචනයේ දී කතුවරයා විසින් අනපේක්ෂිතව අක්ෂර, වචන හෝ ඡේද මඟහැරී යෑම (Haplography)[12] තවත් දෝෂයකි. එක් පිටපතක භගතො යන්නෙහි ග අක්ෂරය ද, සම්මාසම්බුස්ස යන්නෙහි ද්ධ සංයුක්තය ද, ආන්ද යන්නෙහි න අක්ෂරය ද එසේ කතුවරයා අතින් මඟහැරීමේ දෝෂයෙන් ඇති වූ නිදර්ශන කිහිපයකි. එසේම අකුරු හෝ වචන මාරුවීමේ දෝෂය හෙවත් වර්ණ විපර්යාශ (Anagrammatism/Trasposition)[13] පිටපත් රචකයින් අතින් ඉතා සියුම්ව සිදුවන දෝෂයකි. චාපාලං වෙනුවට පාචාලං යනු ද, ආවසථාගාරං වෙනුවට ආසවථාගාරං යනුවෙන් යෙදී ඇති අවස්ථා එයට නිදර්ශනයි.

පුස්කොළ රචනයේ දී රචකයා අතින් ගිලිහුණු අක්ෂර, වචන හෝ වාක්‍ය නැවත මුල්පෙළට ඇතුළත් කිරීම ද (Interpolation)[14] තවත් විශේෂ ලක්ෂණයකි. එසේ කරනුයේ මුල් පෙළට සිදු වූ දෝෂයෙන් මඟහරවා ගැනීමේ ප්‍රයත්නයක් වශයෙනි. එහි දී එකතුකිරීමේ ලකුණ (+) භාවිත කරමින් මඟහැරුණු අක්ෂර හෝ වචන නැවත පිහිටුවීම දැකිය හැකි අතර කිසිදු සංකේතයක් නොමැතිව එකතු කිරීම් ද දැකිය හැකිය. මෙම ලක්ෂණය පුස්කොළ විමර්ශනයේ දී බහුලව දැකිය හැකි අතර අස්ගිරිය විජයසුන්දරාරාමයේ ඇති දීඝනිකාය පිටපතෙහි බාරානං යනුවෙන් ලිය වී නැවත එහි ගිළිහුණු හි එකතු කර බා (+හි)රානං යනුවෙන් සකස්කිරීම මෙයට උදාහරණයකි. එසේ ම පිඤ්ඤා (+ක) භක්ඛො යනු ද, ගහපති පරිසං (+සමනපරිසං) චාතුම් (+ම) හාරාජික පරිසං යනු ද අක්ෂර ඇතුළත් කිරීමේ ස්වභාවයට නිදර්ශන කිහිපයකි.

සමාන අක්ෂරයකින් හෝ වචනයකින් පටන් ගැනෙන හෝ

අවසන් වන තැන් අතහැරී යෑම (Omission) පිටපත් රචකයා අතින් සිදුවන එබඳු ප්‍රධාන දෝෂයකි. එසේම කවර හෝ අක්ෂරයක් හෝ වචනයක් හෝ වගන්තියක් මූල පාඨයෙන් මඟහැරීම මෙයින් අදහස් කෙරේ. මඟහැරීම (Haplography) යනුවෙන් දැක්වූයේ මෙහිම එක් ප්‍රභේදයකි.

සමාන අක්ෂර හෝ වචන හේතුකොට ගෙන රචකයා අතින් සිදුවන පුනරුක්ති හෙවත් එක අක්ෂරය හෝ වචනය නැවත යෙදීමේ දෝෂය (Addition) තවත් වැරැද්දකි. එසේම ගිලිහුණු අක්ෂර හෝ වචන නැවත එකතු කිරීම, අලුතින් සටහන්, පාඨ යෙදීම ආදි ලක්ෂණ මෙයට ඇතුළත්ය. අන්තර් නිවේශනය (Interpolation), පුනරුක්ති (Dittography/Repetition) ආදි ප්‍රභේදයන්ගෙන් විවරිත වූයේ ද මෙම ලක්ෂණයයි. රචකයා අතින් වැරදි ලෙස ලියවුණු පාඨ හෝ වගන්ති නිවැරදි කිරීමට යාමේ දී පාඨකයාට කියවීමට නොහැකි තරමේ ව්‍යාකූල පාඨ (Corruption) බිහිවීම් සිදු වේ. අක්ෂර මත නැවත ලියවීම, අක්ෂර මකා දැමීම, වැරදි තැන් මකා දමා වෙනත් තැනක සටහන් කිරීමට යෑම වැනි ක්‍රමවේදයන් නිසා පාඨ දූෂිත බවට හෙවත් ව්‍යාකූල බවට පත්වීම මෙයින් අදහස් කෙරේ.

සෑම පිටපත් රචකයෙකු අතින් ම සිදුවන ප්‍රධාන දෝෂ දෙකකි. එනම් දෘෂ්‍ය දෝෂ (Visual Errors) සහ මනෝවිද්‍යාත්මක දෝෂ (Psychological Errors) යනුයි.[15] මූල කෘතියෙන් අත්පිටපත් දුරස්ථ වනුයේ ද කතුවරයා අතින් සිදුවන මෙම දෝෂ නිසාමය. දෘෂ්‍ය දෝෂ නම් රචකයාගේ ඇස්වල පෙනීමේ දුර්වලකම, අනවධානය හේතුවෙන් සිදුවන ආදේශන, පාඨ මඟහැරීම සහ එකතුකිරීම වැනි දෝෂ පිටපතට ඇතුළත් වීමයි. මනෝවිද්‍යාත්මක දෝෂ නම් යම් අර්ථයක් වරදවා වටහා ගැනීමට හෝ ආදර්ශ පිටපතෙහි ඇතුළත් වූ දෝෂ නිරවද්‍ය කිරීමට යෑමේ නැඹුරුතාව නිසා ඇතිවන දෝෂයි.

## යෝග්‍ය පාඨ තෝරාගැනීම

විවිධ පාඨාන්තර කිහිපයක් ඇති විට කර්තෘහුගේ පාඨය කුමක් දැයි අවධානයෙන් යුතුව තෝරාගත යුතුය. පාඨාන්තර ඔස්සේ නිශ්චිත

නිගමනයකට බැසීම සඳහා කර්තෘගේ භාෂාව හා රචනා ශෛලිය මැනවින් වටහා ගැනීමත් තත්කාලීන සෙසු සාහිත්‍ය කෘති පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමත් ග්‍රන්ථයේ අන්තර්ගතය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමත් බෙහෙවින් උපකාරී වේ. තැනට යෝග්‍ය වූ අර්ථයක් ගෙන දෙන පමණින් පාඨාන්තරවලට බැස ගැනීමට නොගිය යුතු අතර අත්තනෝමතිකව ඇතුළත් කරන පාඨවලින් මුල් පෙළට බොහෝ අසාධාරණයක් වීමට ඉඩ ඇත. යෝග්‍ය පාඨ තෝරා ගැනීම ඉතා අවධානයෙන් යුතුව සිදුකළ යුතු කාර්යයකි.

ඇතැම් සංස්කාරකයෝ හුදෙක් පාඨාන්තරයන්ටම සීමා වී බාහිරව කිසිදු පාඨයක් අධ්‍යයනය නොකොට පාඨාන්තර අතුරෙන් ම වඩා යෝග්‍යය යැයි හැඟීයන පාඨයක් පෙළට ඇතුළත් කරමින් ග්‍රන්ථ සංස්කරණයෙහි නිරත වෙති. එසේම ඇතැම් සංස්කාරකයෝ පාඨාන්තර පරීක්ෂා කොට බලා ඉන් එකක්වත් හාත්පසින් ම පෙළට නොගැළපේ නම් තමාට අභිමත පාඨයක් බාහිරෙන් තෝරාගෙන පාඨාන්තර සියල්ල අධෝලිපි වශයෙන් දක්වා පෙළ සකස් කරති. ශාස්ත්‍රීය සංස්කරණයකින් අපේක්ෂිත කාර්යය නම් කර්තෘහුගේ කෘතියෙහි යථා තත්වය ඉදිරිපත් කර ලීමයි. මෙහිදී මුල් කර්තෘගේ වියත් නොවියත්කම් ද දක්ෂ යෙදීම් සහ ව්‍යාකූල තැන් ද ඔහුට විශේෂ යැයි කිවහැකි ප්‍රයෝග ද දැන ගැනීමට පාඨකයාට ඉඩ සැලැස්විය යුතුය.

## ආන්තික සටහන්

1. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, ආරිය ලගමුව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2006, 111 පිටුව.
2. Indian Textual Criticism (ITC), S.M. Katre, Deccan Collage, Poona, 1954, p. 40.
3. Pali Manuscripts in Sri Lanka, Bhikkhu ñānatusita, Mainland Souht East Asian Manuscripts in Sri Lanka, Kandy, 2010, pp. 9-11.
4. A Companion to Classical Texts (CCT), F.W. Hall, Oxford, 1913, p. 150; ITC, p. 19.

5. CCT, p. 136; ITC, p. 40.
6. CCT, pp. 24-5; ITC, p. 24.
7. CCT, p. 49; ITC, p. 42.
8. CCT, p. 288.
9. CCT, p. 187; ITC, p.54.
10. CCT, p. 107; ITC, p. 55.
11. CCT, p. 154; ITC, p. 56, p. 58.
12. CCT, p. 154; ITC, p. 56, p. 58.
13. CCT, p. 157; ITC, p. 55, p. 58.
14. CCT, p. 154; ITC, p. 55, pp. 60-1.
15. ICT, p. 22.